ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 අප්‍රේල් 22 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 අප්‍රේල්

2014 මාර්තු මාසයේ දී මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සියයට 4.2 ක් ලෙස පෙර මාසයේ පැවති අගයෙහිම නොවෙනස්ව පැවතුණු අතර මූලික උද්ධමනය 2014 පෙබරවාරි මස පැවති සියයට 3.1 සිට මාර්තු මාසයේ දී සියයට 3.4 දක්වා සුළු වශයෙන් ඉහළ යමින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ මට්ටමක පැවතුණි. නියඟ තත්ත්වයන් හේතුකොටගෙන සැපයුම අඩුවීම නිසා ඉදිරියේදී යම් මිල පීඩනයක් ඇති විය හැකි වුවත් හිතකර උද්ධමන අපේක්ෂාවන් සහ ඉල්ලුමෙන් ඇතිවන උද්ධමන පීඩන අඩුවීම උපකාරීකොටගෙන වසර මුළුල්ලේම උද්ධමනය මැදි තනි අංකයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශයෙන් ගත්කළ, 2014 පෙබරවාරි මාසයේදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර 2014 වසරේ පළමු කාර්තුව තුළ දී සංචාරක ඉපැයුම්ද ඉහළ ගියේය. 2014 පෙබරවාරි අග වන විට දළ නිළ සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.0 ක් පමණ වූ අතර එය ආනයනික මාස 5.3 කට සමාන විය. 2014 අප්‍රේල් මාසයේ දී සිදු කරන ලද එ.ජ.ඩොලර් මිලියන 500 ක ස්වෛරීත්ව බැඳුම්කරයේ අරමුදල් ලැබීමත් සමඟ සංචිත මට්ටම තවදුරටත් වර්ධනය වනු ඇත.

පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය, මාස 38 ක කාලපරිච්ඡේදයක් තුළ එහි අවම අගය වාර්තා කරමින් 2014 පෙබරවාරි මාසයේ දී සියයට 14.7 දක්වා අඩු වූ අතර පළමු කාර්තුව තුළ දී කාර්තුමය සාමාන්‍ය පදනම මත ගණනය කරනු ලබන සංචිත මුදල් එහි පුරෝකථනය කරන ලද මට්ටමේ පැවතුණි. 2014 පෙබරවාරි මාසයේ දී පුළුල් මුදල් සැපයුමෙහි, පෞද්ගලික අංශයේ ණය වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පෙර මාසයේ දී පැවති සියයට 5.2 සිට සියයට 4.4 කින් සුළු වශයෙන් වර්ධනය විය. මේ අතර, රජය විසින් 2014 ජනවාරි මස නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල් රාජ්‍ය බැංකු සමඟ පවත්වාගෙන යනු ලබන රජයේ බැංකු අයිරා ශේෂයන් අඩු කිරීමට යොදාගැනීමත් සමඟ වසරේ පළමු මාස දෙක තුළ දී රජය වෙත ලබාදුන් ශුද්ධ ණය රුපියල් බිලියන 43.3 ක් විය. එසේම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ශුද්ධ ණය පියවීම් හේතුවෙන් රාජ්‍ය සංස්ථා මඟින් ලබාගන්නා ලද ණය 2014 පෙබරවාරි මාසයේ දී තවදුරටත් අඩු විය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩවම සිදුවීමත් සමඟ 2014 අප්‍රේල් මස සිදුකරන ලද ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මඟින් රාජ්‍ය අංශය බැංකු මූල්‍යනය මත රඳාපැවැත්ම ඉදිරි මාසවල දී අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණවත් වෙළෙඳපොළ ද්‍රවශීලතා මට්ටම් මඟින් සවිබල ගැන්වුණු පෞද්ගලික ආයෝජන සඳහා මුදාහැරෙන අරමුදල් මඟින් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට අවශ්‍ය අනුබලයන් සපයනු ඇති අතර ඒ හරහා අපේක්ෂිත පරිදි වසරේ දෙවන කාර්තුවේ සිට ණය වර්ධනය ප්‍රසාරණය වනු ඇත.

මෙම පසුබිම යටතේ, විදේශීය අංශය යථා තත්ත්වයට පත්වීම, ඉදිකිරීම් සහ නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි තිරසාර වර්ධන ප්‍රවණතාව මෙන්ම මුදල් සමස්තයන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මකවීමත් සමඟ උද්ධමනය අඩු සහ ස්ථායී මට්ටමක පැවතීම තුළින් ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් වර්ධනයක් අත්පත් කරගනු ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2014 අප්‍රේල් මස 21 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුදුසුයැයි මුදල් මණ්ඩලයෙහි අදහස වූ අතර, ඒ අනුව මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් සියයට 6.50 ක් සහ සියයට 8.00 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේදී ප්‍රකාශයට පත්කරනු ලැබේ.